සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

43 S II

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

# First Term Test - Grade 10 - 2020


චිත්‍ර කලාව - II - කාලය : පැය 02 යි.

**විභාග ශාලාධිපතීන්ට උපදෙස්**

- රූප සටහනෙහි දක්නට ඇති අයුරින් ද්‍රව්‍ය සමූහය සකස් කරන්න.
- ද්‍රව්‍ය සමූහය ඇස් මට්ටමෙන් පහළ සිටින ලෙස සකස් කරන්න.
- පැලැටියේ ඉහළ සීමාව ඇස් මට්ටමට ඉහළින් පිහිටීම වරදක් නැත.
- ද්‍රව්‍ය සමූහය තැබීමට සුදුසු ආධාරකයක් (ඩ්‍රෝවින් බෝඩ් එකක්/පැතලි ඩෙක්ස් එකක් - ශිෂ්‍ය) භාවිතා කරන්න.
- චිත්‍ර 2ක් වෙන වෙනම ඇඳීමට උපදෙස් දෙන්න.
  (එක් චිත්‍රයක් දළ සටහන ද අනෙක වර්ණ චිත්‍රය ද විය යුතුය.)

**යෝජිත ද්‍රව්‍ය**

01. ඇන්තූරියම් පත්‍ර 2ක් හා මලක් (රවුම් වීදුරු 1/2 (භාග) බෝතලයකට දමන්න.)
02. තැඹිලි ගෙඩියක්
03. සුදු පැහැති ඩිමයි කඩදාසියකින් ඔතන ලද ද්‍රව්‍ය සමූහයට ගැළපෙන පෙට්ටියක්
04. සුදුසු ආධාරකයක්



සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

43 | S | I

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

## First Term Test - Grade 10 - 2020

**චිත්‍ර කලාව - I -**

කාලය : පැය 01 යි.

නම/විභාග අංකය : ............................................................................................ ශ්‍රේණිය/පන්තිය:- .............

- සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- **පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



01. මෙම වාස්තු විද්‍යා නිර්මාණය ............................................................................................ විහාර භූමියේ පිහිටා ඇත.

02. හතරවන බුවනෙකබාහු රජ දවස ඉදිකරන ලද මෙය ................................................................. යුගයට අයත් නිර්මාණයකි.

03. මෙම සුවිශේෂී නිර්මාණය ............................................................................................ නමින් හැඳින් වේ.

04. මෙහි නිර්මාණ ශිල්පියා වන්නේ දකුණු ඉන්දීය ශිල්පියෙකු වන ............................................................................හා ඔහුගේ අනුගාමික ශිල්පීන් ය.

05. ස්තූපය වටා ඇති පරිවාර චෛත්‍යය හතර ගොඩනගා ඇත්තේ ............................................................................ වල පියස්ස මතය.

- **අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

06. මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ මතය අනුව සඳකඩ පහනේ ''ඇත්, අශ්ව, සිංහ, ගව'' යන සත්වාවලියෙන් නිරූපණය වන්නේ කුමක් ද? ............................................................................................

07. මහනුවර යුගයේ සිතුවම් සම්ප්‍රදායට නෑකම් කියන ලංකාතිලක විහාරයේ සිතුවම් අතර දක්නට ඇත්තේ කුමන රජුගේ රූපය ද? ............................................................................................

08. පූජනීය ස්ථානයකට හෝ ගොඩනැගිල්ලකට පිවිසෙන පඩි පෙළ දෙපස අත්වැලක් සේ යෙදූ සුවිසල් ගල් පුවරු දෙක හඳුන්වන නම කුමක් ද? ............................................................................................

09. ''ඇත්-සොඬ, සිංහ-පාද, උෟරු-කන්'' ආදී සත්ත්ව කොටස් හතක් එක් කරමින් නිර්මාණය කරන ලද කල්පිත සත්ත්ව රූපය කුමන නමකින් හැඳින්වේ ද?............................................................................................

10. හින්දු සහ බෞද්ධාගමික මූර්තිවල යමක් අල්ලාගෙන සිටින ආකාරය නිරූපණය වන මුද්‍රාව හඳුන්වන්නේ කුමන නමකින් ද? ............................................................................................

● **අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11. දාගැබක ධාතුගර්භය හා පාදම අතර ඇති කොටස හඳුන්වන්නේ ......
    1. හතරැස් කොටුව නමිනි. 2. පේසා වළලු නමිනි.
    3. කොත්කැරැල්ල නමිනි. 4. දේවතා කොටුව නමිනි.

12. එම්. සාර්ලිස් ශිල්පියා බෞද්ධ චිත්‍ර සිංහල බෞද්ධ ජනතාව අතර වඩාත් ප්‍රචලිත කිරීමට පුරෝගාමී වූයේ.....
    1. ලිතෝ මුද්‍රිත ක්‍රමය ලංකාවට හඳුන්වා දීම සඳහා ය.
    2. බටහිර යථාර්ථවාදී චිත්‍ර කලාව ප්‍රචලිත කිරීම සඳහා ය.
    3. යටත් විජිත කරණයට එරෙහි වෙමින් නිවෙස්වල තිබූ බ්‍රිතාන්‍ය රැජිනගේ රූප ඉවත් කිරීම සඳහා ය.
    4. බෞද්ධ ජාතක කතා මගින් බෞද්ධ ජනතාවට ධර්මය අවබෝධ කරවීම සඳහා ය.

13. සාම්ප්‍රදායික සැරසිලි මෝස්තරයක් වන ''ලියවැල''.....
    1. ජ්‍යාමිතික ගණයට අයත් මෝස්තරයකි.
    2. ජ්‍යාමිතික උපකරණ භාවිතයෙන් නිරූපිත මෝස්තරයකි.
    3. තීරු දෙකක් අතර ඇඳි නිර්ජීවී මෝස්තරයකි.
    4. උද්භිද ගණයට අයත් මෝස්තරයකි.

14. මිනරේට් (මිනාර්) නම් ගෘහ නිර්මාණ අංගය.....
    1. ඉස්ලාම් පල්ලියේ මුදුනෙහි ඇති ගෝලාකාර වස්තුවක් ලෙස දැකිය හැක.
    2. හින්දු කෝවිලෙහි පිවිසුම් දොරටුවෙහි ඉහළින් ඇති මූර්ති සහිත කොටසයි.
    3. ඉස්ලාම් පල්ලියේ දෙපස උස්වූ කුළුණු වශයෙන් දැකිය හැකිය.
    4. ඉස්ලාම් ආගමේ සංකේතය වන අඩ සඳ හා තරුව හැඳින්වීමට යෙදෙයි.

15. අනුරාධපුර රුවන්වැලිසෑය වටා ඇති පවුර.....
    1. වලාකුළු බැම්මක් ලෙස නිර්මාණය කර ඇත. 2. ඇත් රූපවලින් නිර්මාණය කර ඇත.
    3. දුටුගැමුණු රජුගේ ප්‍රතිමාවක් සහිතව නිර්මාණය කර ඇත. 4. කළු ගලින් නිර්මාණය කර ඇත.

● **අංක 16 සිට 20 දක්වා දී ඇති රූප සටහන් හඳුනාගෙන ඊට වඩාත් සමීපතාවක් දක්වන රූපය A, B, C, D, E යන රූප ඇසුරෙන් තෝරා එහි අක්ෂරය තිත් ඉර මත ලියන්න.**

16.  (............................)

17.  (............................)

18.  (............................)

19.  (............................)

20.  (............................)

(A) 

(B) 

(C) 

(D) 

(E) 

● **අංක 21 සිට 25 දක්වා ඇති වාක්‍යයෙහි හිස්තැනට සුදුසු වචනය යොදා වාක්‍යය සම්පූර්ණ කරන්න.**

21. චිත්‍රයක දුර ඇති වස්තූන් කුඩාවටත් ළඟ ඇති වස්තූන් විශාල ලෙසත් ඇඳීම ........................................................ නමින් හඳුන්වයි.

22. යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික සිතුවම් අතර ඇති අඩි 17 දිග ගවරුව ........................................................ ගුහාව තුළ දක්නට ඇත.

23. හින්දු කෝවිල් ආශ්‍රිතව දේව රූප තැන්පත් කර පෙරහැරේ ගෙනයාමට භාවිත කළ දැවයෙන් නිර්මාණය කළ වාහනය ........................................................ යනුවෙන් හඳුන්වයි.

24. ලාක්ෂා කර්මාන්තය මහනුවර යුගයේ දී වඩාත් ප්‍රචලිතව පැවති අතර ලාක්ෂා ශිල්පීන් ........................................................ යනුවෙන් මෙම යුගයේ දී හඳුන්වා ඇත.

25. 1949 දී නිර්මාණය කරන ලද වර්තමාන ජාතික කොඩියේ තද රතු පාට පසුබිමෙන් නිරූපණය වන්නේ ...................... ........................................................ බව පිළිගැනේ.

● **අංක 26 සිට 30 දක්වා දී ඇති ප්‍රශ්නවලට F, G, H, I, J යන රූප සටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.**


F


G


H


I


J

26. F අක්ෂරයෙන් දැක්වෙන දාගැබෙහි ගර්භයේ මුල්ම හැඩය කුමක් ද? ........................................................................

27. G අක්ෂරයෙන් දැක්වෙන රූපයෙහි ප්‍රධාන මානව රූපයෙන් දැක්වෙන ඉරියව්ව හඳුන්වන නම කුමක් ද? ............................ ..................................................................................

28. H අක්ෂරයෙන් දැක්වෙන සාම්ප්‍රදායික මෝස්තරවල උද්භිද ඝනයට අයත් මෙම නිර්මාණය හඳුන්වන නම කුමක් ද? ..................................................................................

29. I අක්ෂරයෙන් දැක්වෙන නිර්මාණය වර්ණ ගැන්වීමට පෙර අතීත ශිල්පීන් මුලින්ම තවරන ආලේපය හඳුන්වන්නේ කුමන නමකින්ද? ..................................................................................

30. J අක්ෂරයෙන් දැක්වෙන බුදුපිළිමයේ ප්‍රකාශිත මුද්‍රාව කුමක් ද? ........................................................................

● **අංක 31 සිට 35 දක්වා දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍ය බැගින් ලියන්න.**

31. ගෝපුරඃ- ........................................................................................................

32. සකපෝරුවඃ- ........................................................................................................

33. සන්නිදර්ශනඃ- ........................................................................................................

34. තිරිගිතලය:- ..............................................................................................................................................................................

35. වටදා ගෙය:-..................................................................................................................................................................................

● **පහත දී ඇති චිත්‍රය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහවන පරිදි අංක 36 සිට 40 දක්වා දී ඇති උප මාතෘකාවලට අදාලව අර්ථවත්ව වාක්‍ය පහක් ලියන්න.**



36. ශිල්පියා පිළිබඳව:- ..............................................................................................................................................................
..............................................................................................................................................................................................

37. නිරූපිත තේමාව:- ..................................................................................................................................................................
..............................................................................................................................................................................................

38. ස්ථානය පිළිබඳව:- ................................................................................................................................................................
..............................................................................................................................................................................................

39. වර්ණ හා රේඛා භාවිතය:- ......................................................................................................................................................
..............................................................................................................................................................................................

40. හැඟීම් ප්‍රකාශනය:- ..................................................................................................................................................................
..............................................................................................................................................................................................

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

43 S II

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

# First Term Test - Grade 10 - 2020

චිත්‍ර කලාව - II -

කාලය : පැය 02 යි.

**● ඔබේ විභාග අංකය /නම සහ පන්තිය/ශ්‍රේණිය උත්තර පත්‍රයේ පිටුපස පැහැදිලිව ලියන්න.**

- නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය
- ඔබේ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කොට,

1. රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න.
2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ වර්ණ කරන්න.

මෙම චිත්‍ර දෙකම එකට අමුණා විභාග ශාලාධිපතිට දෙන්න.

**● ඔබේ චිත්‍රය ඇගයීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව අවධානයට යොමු කරන්න.**

**● රේඛා අධ්‍යයනය**

1. මුල් කඩදාසියේ කරනු ලබන පූර්ව අධ්‍යයනයේදී ඇති කුසලතාවය

**● වර්ණ චිත්‍රය**

2. ද්‍රව්‍ය සමූහය කලාත්මකව සම්පින්ඩනය වීම
3. පරිමාණය හා පර්යාවලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය
4. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වාභාවික හා ගති ලක්ෂණ දක්වීම
5. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතා
6. උචිත පසුබිමක් යෙදීම හා සමස්ථ නිමාව

**● සැලකිය යුතුයි.**

**ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ල විශාල ලෙස ඇඳීම අවශ්‍ය නොවේ. ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සමූහයට ගැළපෙන අයුරින් වෙනස් කර ඇඳීමට ඔබට අවසර ඇත.**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

43 S III

# පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

# First Term Test - Grade 10 - 2020

**චිත්‍ර කලාව - III පත්‍රය** කාලය : පැය 02 යි.

**චිත්‍රය පසුපිටෙහි ඔබේ නම/විභාග අංකය, පන්තිය /ශ්‍රේණිය මාතෘකාවේ අංකය සටහන් කරන්න.**

- පහත සඳහන් 'අ' 'ආ' සහ 'ඉ' කොටස් තුළ ඇති මාතෘකා අතරින් එක් මාතෘකාවක් පමණක් තෝරා ගෙන වර්ණවත් චිත්‍රයක් නිර්මාණය කරන්න.

## 'අ' ප්‍රකාශන චිත්‍ර

01. බස් නැවතුමක හෝ දුම්රිය නැවතුමක කලබලකාරී අවස්ථාවක්
02. පාසලක ක්‍රීඩා උත්සවයක ඔබ සිත්ගත් අවස්ථාවක්
03. මුහුදු වෙරළේ කෙළි දෙලෙන් පසුවන ළමුන් පිරිසක්
04. ගව හෝ එළු පට්ටියක් බලාගන්නා ගොපළු දරුවෙක්

## 'ආ' මෝස්තර චිත්‍ර

05. නිර්මාණාත්මක මලක් සහ කොළයක් ඇසුරින් චීත්ත රෙද්දකට සුදුසු මෝස්තරයක් මුද්‍රණය කිරීමට සුදුසු පරිදි 9'' × 9'' ප්‍රමාණයට සැලසුම් කරන්න.
06. වෘත්තාකාර පිත්තල බන්දේසියක් ඇඳ සාම්ප්‍රදායික සැරසිලි යොදා අලංකාර කරන්න.
07. ඍජුකෝණාස්‍රාකාර මේස රෙද්දකට සුදුසු 6'' × 9'' ප්‍රමාණයේ මුළුතල මෝස්තරයක් නිර්මාණය කරන්න.

## ''ඉ'' ග්‍රැෆික් චිත්‍ර

08. ''වන සම්පත සුරකිමු'' තේමාවට අදාළව පෝස්ටරයක් නිර්මාණය කරන්න.
09. රසකැවිලි බහාලන ඇසුරුමක් සඳහා සුදුසු අලංකාර නිර්මාණයක් සැලසුම් කරන්න.
10. ඔබ වඩාත් කැමති ළමා කතා පොතකට පිටකවරයක් නිර්මාණය කරන්න. (මුල කවරය සහ පසු කවරය යන කොටස් දෙකින්ම යුක්ත විය යුතුය.) උචිත නමක් ද යොදන්න.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

Answer

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

43 S I-II-III

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

# First Term Test - Grade 10 - 2020

## චිත්‍ර කලාව - පිළිතුරු පත්‍රය

01. ගඩලාදෙණිය
02. ගම්පොල
03. විජයොත්පාය
04. ගණේවරාචාර්ය
05. ප්‍රතිමා ගෘහ/පිළිම ගෙවල්
06. ජාති, ජරා, ව්‍යාධි, මරණ/සතර බිය
07. කීර්ති ශ්‍රී රාජසිංහ
08. කොරවක්ගල/කයියෝරුගල
09. මකර රුව/මකරා
10. කටක හස්ත
11. 02
12. 03
13. 04
14. 03
15. 02
16. B
17. C
18. E
19. A
20. D
21. පර්යාවලෝකය
22. ලැස්කෝ
23. මරවාහනම්
24. හංගිඩියන්
25. සිංහල ජනතාව
26. ධාන්‍යාකාර
27. ත්‍රිභංග ඉරියව්ව
28. නාරිලතාමල
29. අල්ලියාදු
30. පරදුක්ඛ දුක්ඛිත
31. **ගෝපුර** - හින්දු කෝවිලක ප්‍රධාන දොරටුවට ඉහළින් ඇති ගෘහ නිර්මාණ අංගයයි.
32. **සකපෝරුව** - මැටි භාණ්ඩ තැනීමේ දී යොදා ගන්නා උපකරණයකි. (අතීතයේ දී)
33. **සන්නිදර්ශන** - කවියක, කෙටි කතාවක, ලිපියක අර්ථය වඩාත් තීව්‍ර කිරීම සඳහා අඳිනු ලබන චිත්‍ර හඳුන්වන්නේ මෙනමිනි.
34. **තිරිඟිතලය** - අතීත ශිල්පීන් වකදෙක ඇඳීමෙන් පසු එහි ඉදිරි පියවරක් ලෙස සංකීර්ණ රටා සහිතව නිර්මාණය කරන මෝස්තරයකි.
    (ගෝලයාගේ පරිණත බව මැනීමේ අභ්‍යාසයකි.)
35. **වටදාගෙය** - කුඩා චෛත්‍ය වටා තනන ලද ගෘහය මෙනමින් හැඳින්වේ.
    චෛත්‍යයේ ආරක්ෂාව සඳහාත් බැතිමතුන්ගේ පහසුව සඳහාත් කුඩා චෛත්‍ය වටා ඉදිකර ඇති ගෘහය
36. නූතන යුගයේ ශිල්පියෙකු වන සෝලියස් මෙන්ඩිස් ශිල්පියාගේ නිර්මාණයකි.
37. හේමමාලා කුමරිය හා දන්ත කුමරු ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කරවීම.
38. නව කැළණි විහාරයේ මෙම සිතුවම් ඇඳ ඇත.
39. ඉතා රිද්මයානුකූල හා ප්‍රකාශන ගුණයෙන් යුතු සියුම් රේඛාකරණය සහ සංගත වර්ණ මාලාවක් දැකිය හැකිය.
40. භක්තිය හා ගෞරවය දනවෙන පරිදි නිර්මාණය කර ඇත. හෝ එවැනි අර්ථය දෙන වෙනත් වාක්‍යයකට වුවද ලකුණු ලබා දෙන්න.

(1 × 40 = 40) එක ප්‍රශ්නයකට එක ලකුණ බැගින් ලබා දෙන්න.

**Answer**

## II පත්‍රය

### ලකුණු දීමේ නිර්ණායකඃ ස්වභාවිකත්ව අධ්‍යයනය හා ද්‍රව්‍ය සම්පිණ්ඩනය

| | | |
|---|---|---|
| (1) | ද්‍රව්‍ය අධ්‍යයනයේ දී නිදහස්ව, අර්ථවත්ව, රේඛාව හැසිරවීම | - ලකුණු 05 |
| (2) | තලය අර්ථවත්ව හැසිරවීම | - ලකුණු 05 |
| (3) | පරිමාණය හා ගති ස්වභාවය | - ලකුණු 05 |
| (4) | සිද්ධාන්ත භාවිත අවබෝධය (පර්යාවලෝකය, සංඝත්වය, ඇස් මට්ටම) | - ලකුණු 05 |
| (5) | වර්ණ භාවිතය හා ගති ලක්ෂණ දක්වීම | - ලකුණු 05 |
| (6) | සමස්ත නිමාව/පසුබිම දක්වීම | - ලකුණු 05 |
| | II වන පත්‍රය සඳහා හිමි ලකුණු | ලකුණු 30 |

## III පත්‍රය ''අ'' කොටස චිත්‍ර සංරචනය

ලකුණු දීමේ නිර්ණායක

| | | |
|---|---|---|
| (1) | තෝරාගත් මාතෘකාව ප්‍රකාශ කිරීමේ දී ඊට උචිත වාතාවරණය හා ප්‍රකාශ කර ඇති අයුරු | - ලකුණු 06 |
| (2) | මානව රූ හා සත්ත්ව රූ ඇතුළු සියළු හැඩතල තල මත සම්පිණ්ඩනය කර ඇති අයුරු | - ලකුණු 06 |
| (3) | රේඛාවේ හා හැඩතලවල පරිණත බව | - ලකුණු 06 |
| (4) | වර්ණ භාවිතයේ කුසලතාව | - ලකුණු 06 |
| (5) | සමස්ත නිමාව | - ලකුණු 06 |
| | **මුළු ලකුණු** | ලකුණු 30 |

## III පත්‍රය ''ආ'' කොටස මෝස්තර හා සැරසිලි නිර්මාණය

ලකුණු දීමේ නිර්ණායක

| | | |
|---|---|---|
| (1) | මාතෘකාවට හා කාර්යයට උචිත අයුරින් නව්‍යතාවයකින් යුතුව සැලසුම් කිරීම | - ලකුණු 06 |
| (2) | පාරිභාරික අවශ්‍යතාවයන්ට ගැළපෙන බව හා කර්මාන්තයට උචිත බව | - ලකුණු 06 |
| (3) | හැඩතල සම්පිණ්ඩනය හා නිර්මාණාත්මක බව | - ලකුණු 06 |
| (4) | වර්ණ තෝරා ගැනීම හා භාවිතය | - ලකුණු 06 |
| (5) | විචිත්‍රත්වය, චමත්කාර බව, නිර්මාණයේ සාර්ථක බව | - ලකුණු 06 |
| | **මුළු ලකුණු** | ලකුණු 30 |

## III පත්‍රය ''ඉ'' කොටස ග්‍රැෆික් චිත්‍ර

ලකුණු දීමේ නිර්ණායක

| | | |
|---|---|---|
| (1) | මාතෘකාවට අදාළ නිර්මාණ කාර්යයට උචිත අයුරින් නවතාවයෙන් සැලසුම් කිරීම | - ලකුණු 06 |
| (2) | වාණිජමය හා සන්නිවේදන අවශ්‍යතාවයන්ට ගැළපෙන බව හා මුද්‍රණයට උචිත බව | - ලකුණු 06 |
| (3) | රේඛා හා හැඩතල හා සැරසිලි අර්ථවත්ව යෙදීම | - ලකුණු 06 |
| (4) | උචිත වර්ණ භාවිතය | - ලකුණු 06 |
| (5) | විචිත්‍රත්වය, චමත්කාරජනක බව හා නිර්මාණයේ සාර්ථකත්වය | - ලකුණු 06 |
| | **මුළු ලකුණු** | ලකුණු 30 |

| | | | | |
|---|---|---|---|---|
| (i) | - | පත්‍රය සඳහා - ලකුණු | = | 40 |
| (ii) | - | පත්‍රය සඳහා - ලකුණු | = | 30 |
| (iii) | - | පත්‍රය සඳහා - ලකුණු | = | 30 |
| | | මුළු ලකුණු | = | 100 |